සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

# නර්තනය

9 ශ්‍රේණිය

කාලය පැය 1 1/2 යි.

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

**01 - 20 දක්වා ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01 දොලොස්වන පා සරඹයේ සරඹ නාමය වන්නේ,
(1) දෑත පැගීමේ සරඹය ය. (2) සිව් අඩිය ය.
(3) දූළ අඩිය ය. (4) සුරල් අඩිය ය.

02 9 වන ගොඩ සරඹයේ සරඹ නාමය වන්නේ,
(1) බඹර සරඹය. (2) චන්ද්‍රිකා සරඹය.
(3) දෑත පැගීමේ සරඹය. (4) අංගහාර සරඹය.

03 නව ග්‍රහයින් මුල් කොටගෙන ගායනා කරනු ලබන ගායන විශේෂයකි,
(1) සිරස පාද කවි (2) ග්‍රහ පංති කවි (3) මල් යහන් කවි (4) කළගෙඩි කවි

04 තකට දොදොංතා දොංගඩ තරිකිට ....... මෙය,
(1) වෛරොඩි වන්නමේ සීරුමාරුවයි.
(2) තුරඟා වන්නමේ සීරුමාරුවයි.
(3) තුරඟා වන්නමේ කස්තිරමයි.
(4) වෛරොඩි වන්නමේ කස්තිරමයි.

05 ඉල්ලම් මුදු භාවිතයෙන් හඬ සුසර කර ගන්නා වාද්‍ය භාණ්ඩය වන්නේ,
(1) තම්මැට්ටමයි (2) දවුලයි
(3) ගැටබෙරයයි (4) දෙවොල් බෙරයයි

06 සතර බීජාක්ෂර මුල්කරගෙන සැකසී ඇති බෙර වාදන අංගයකි,
(1) බෙර සරඹ (2) අංගුලියා පදය (3) බුලත් පදය (4) මඟුල් බෙර

07 සරල සැරසිලි අංගයක් නොවන්නේ,
(1) සරල පියුම (2) ගොප් ගෙඩිය (3) පිදේනි තටුව (4) සුරත් තට්ටුව

08 නව රාත්‍රී උත්සවය,
(1) ඉස්ලාම් බැතිමතුන්ගේ ආගමික උත්සවයකි.
(2) බෞද්ධ ආගමික උත්සවයකි.
(3) හින්දු ආගමික උත්සවයකි.
(4) සර්ව ආගමික උත්සවයකි.

09 ගම්පොළ යුගයේ පැවති නර්තන කලාව පිළිබඳ වාර්තා කල දේශාටන වාර්තා කරුවෙකු වන්නේ,
(1) ස්පිල් බර්ජන් ය (2) නාරායන මෙනන් ය
(3) ඉබන් බතූතා ය (4) රොබට් නොක්ස් ය

10 පහතරට බෙරය හඳුන්වන වෙනත් නාමයක් නොවන්නේ,

(1) සෝෂක බෙරය (2) දික් බෙරය (3) රුහුණු බෙරය (4) එකැස් බෙරය

11 කඩතුරා කවි ගායනය දක ගත හැක්කේ,

(1) කොහොඹා කංකාරි ශාන්ති කර්මයේ ය.

(2) දෙවොල් මඩු ශාන්ති කර්මයේ ය.

(3) රට යකුම ශාන්ති කර්මයේ ය.

(4) බලි ශාන්ති කර්මයේ ය.

12 ජන ගායනා වල දකිය හැකි මූලික ලක්ෂණයකි,

(1) සංකීර්ණ බව (2) සරල බව (3) පොදු බව (4) සාම්ප්‍රදායික බව

13 දෙතිතේ තාලරූප වලට අයත් නොවන්නේ,

(1) මහ තනි තිත (2) සුලු මැදුම් දෙතිත (3) සුලු මහ දෙතිත (4) මැදුම් මහ දෙතිත

14 එදිනෙදා අපට හමුවන මිනිස් චරිත අතරින් ධීවරයෙකුගේ චරිතයට සුවිශේෂී ලක්ෂණයක් වන්නේ,

(1) මැටි පදම් කිරීම (2) දැල් දැමීම (3) අස්වනු නෙළීම (4) දළු නෙළීම

15 ශාරීරික ස්වස්ථිතාව පවත්වා ගැනීමේ ප්‍රයෝජනයක් නොවන්නේ,

(1) පෞරුෂත්ව වර්ධනය (2) නිරෝගි බව සුපිරිසිදු බව

(3) ශරීර සෞඛ්‍ය පිරිහීයාම (4) සිරුර හැඩ වීම

16 උඩරට ගැට බෙරය වාදනය කරන අවස්ථාවක් නොවන්නේ,

(1) ශාන්ති කර්ම අවස්ථා (2) පිරිත් පිංකම් අවස්ථා

(3) මංගල අවස්ථා (4) සර්කස් සංදර්ශන

17 සිංහරාජ වන්නමේ තාල රූපය වන්නේ,

(1) 4+4 තාල රූපයයි. (2) 2+2 තාල රූපයයි.

(3) 2+3 තාල රූපයයි. (4) 3+3 තාල රූපයයි.

18 ගැට බෙරයේ සම්මත දිග ප්‍රමාණය වන්නේ,

(1) එක් වියත් තුනඟුලයි. (2) විග්ගුස්සයි.

(3) තුන් වියත් තුනඟුලයි. (4) තුන් වියත් දෑඟුලයි.

19 මිනිස් චරිත නිරූපණයේදී සැලකිලිමත් විය යුතු කරුණු අතරින් ප්‍රධාන තැනක් ගනු ලබන්නේ,

(1) චරිතයට අදාල චර්යා ලක්ෂණ (2) යොදා ගන්නා චලන

(3) වාදනය කරන බෙර පද (4) භාවිත කරන රංග උපකරණ

20 ගැට බෙරයේ දකුණු ඇස සඳහා .............. භාවිතා කරයි.

(1) හරක් හම (2) වඳුරු හම (3) මුව හම (4) තලගොයි හම

**9 ශ්‍රේණිය** **නර්තනය - II කොටස**

- **පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න දෙකකට පිළිතුරුසපයන්න.**

01 ඔබ පංති කාමරයේදී සිදු කළ ''නර්තන මාධ්‍යයෙන් මිනිස් චරිත නිරූපණ'' පාඩම ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(i) නර්තන නිර්මාණයට සුදුසු විවිධ මිනිස් චරිත හතරක් නම් කරන්න.

(ii) ඔබ නම් කළ මිනිස් චරිත දෙකක සුවිශේෂී ලක්ෂණ හඳුන්වන්න.

(iii) ඔබ නම් කළ මිනිස් චරිතවල චර්යාලක්ෂණ විස්තර කරන්න.

02 උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ගැටබෙරයයි.

(i) ගැටබෙරයේ බෙරකඳ සෑදීමට සහ බෙරයේ දකුණු ඇස වම් ඇස සඳහා යොදා ගන්නා අමුද්‍රව්‍ය නම් කරන්න.

(ii) ගැටබෙරය වාදනය සඳහා යොදා ගන්නා අවස්ථා පහක් ලියන්න.

(iii) ගැටබෙරයේ රූප සටහනක් ඇඳ කොටස් පහක් නම් කරන්න.

03 (i) ශාරීරික ස්වස්ථතාව යනු කුමක්දැයි කෙටියෙන් විස්තර කරන්න.

(ii) නර්තනයේදී ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීමෙන් ලැබෙන වාසි 03 ක් ලියන්න.

(iii) ශාරීරික ස්වස්ථතාව පවත්වා ගැනීම සඳහා දිනපතා කළයුතු කාර්යයන් 04 ක් ලියන්න.

04 (i) සිංහරාජ වන්නමේ තාලරූපය ලියන්න.

(ii) සිංහරාජ වන්නමේ කවියක් ලියන්න.

05 උඩරට නර්තන සම්ප්‍රදායේ ප්‍රධාන සරඹ වර්ග දෙකකි.

(i) දොළොස්වන පා සරඹයේ සරඹ නාමය ලියා දොළොස්වෙනි සරඹය ලියන්න.

(ii) නවවෙනි ගොඩ සරඹයේ සරඹ නාමය ලියා පදය හා කස්තිරම ලියන්න.

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | 4 | (02) | 3 | (03) | 2 | (04) | 1 | (05) | 2 | (06) | 2 | (07) | 4 | (08) | 3 | (09) | 3 | (10) | 4 |
| (11) | 4 | (12) | 2 | (13) | 1 | (14) | 2 | (15) | 3 | (16) | 4 | (17) | 1 | (18) | 3 | (19) | 1 | (20) | 2 |

## II කොටස

01 (i) ධීවරයා, කුඹල්කරු, ගොවියා, තේ දළු නෙලන්නිය යනාදී වශයෙන් ලියා ඇත්නම් (ල.03)

(ii) නම් කළ චරිතවල ලක්ෂණ ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. [උදාහරණ :- ගොවියා - හිසට සුම්බරයක් බැඳ, උදලු‍ලක් අතට ගෙන, ශරීරයේ උඩ කොටසට ඇඳුමක් නොඇද, නැතිනම් බැනියමක් පමණක් ඇත අමුඩයක් අඳිනු ලැබේ.] (ල.03)

(iii) නම් කර ඇති චරිතවල සුවිශේෂී ලක්ෂණ විස්තර කර ඇත්නම් ලකුණු ලබා දෙන්න. [උදාහරණ :- ගොවියා - බිම සැකසීම (කෙටීම, සීසෑම, පෝරු ගෑම, බීජ ඉසීම, පැල සිටුවීම, නඩත්තුව, අස්වනු නෙළීම)] (ල.04)

02 (i) ● බෙරකඳ සැකසීමට - ඇහැළ, කොහොඹ, කොස් (වරකා), ගංසූරිය ● වම් ඇස - හරක් හම නැතහොත් මුවහම ● දකුණු ඇස - වඳුරු හම, එළුහම, තලගොයි හම (ල.03)

(ii) පිරිත් පිංකම්, තේවාව සඳහා, පෙරහැර, පිළිගැනීමේ උත්සව, මංගල උත්සව, ශාන්ති කර්ම (ල.03)

(iii) බෙරය පැහැදිලිව ඇඳ, කොටස් පහක් නම් කර ඇත්නම් - රූපසටහනට (ල.02) + නම්කිරීම (ල.02)

03 (i) තම ශරීරයෙහි පෞද්ගලික පිරිසිදුකම හා නිරෝගීකම රැකගැනීම ශාරීරික ස්වස්ථතාවයයි. (ල.03)

(ii) ● කාර්යක්ෂමතාව වර්ධනය වීම. ● ශාරීරික වශයෙන් ප්‍රසන්න හා ප්‍රියමනාප පෙනුමක් ඇතිවීම. ● සිරුර හැඩ වීම යන කරුණු සඳහන් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.03)

(iii) ● පිරිසිදු ජලය පානය කිරීම. ● පිරිසිදුව සිටීම. ● පෝෂ්‍යදායි ආහාර ගැනීම. ● ව්‍යායාමවල නිරත වීම..... යනාදී කරුණු සඳහන් කර ඇත්නම් ලකුණු ලබාදෙන්න. (ල.04)

04 (i) මහතනිතිත (4+4 තාලරූපය) (ල.05)

(ii) සිංහරාජ වන්නමේ කවියක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (ල.05)

05 (i) සුරල් අඩිය - තෙයිතක තෙයිතක තෙයිතක තෙයි (ල.05)

(ii) දෑත පෑගීමේ සරඹය :- ● පදය - දොම් කිට කිට දොම් ● කස්තිරම - තකට තකට තක තරිකිට කුංදත් /// ගජිං (ල.05)